දුරකථන / தொலைபேசி இல./Telephone
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832
ලේකම් / செயலாளர் / Secretary } 2784812
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50
ඊමේල් / ஈ-மெயில் / E-mail :- isurupaya@moe.gov.lk
ඔබේ අංකය / உமது இல. / Your No. }

අධ්‍යාපන අමාත්‍යාංශය,
கல்வி அமைச்சு,
Ministry of Education,
"ඉසුරුපාය" , ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
බත්තරමුල්ල.
"இசுருபாய", ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை,
பத்தரமுல்ல.
"Isurupaya", Sri Jayawardhanapura Kotte,
Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. } ED/03/38/3/08

දිනය / திகதி / Date } 2015 මාර්තු මස 26 දින

චක්‍රලේඛ අංකය : 12/2015

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
සියළුම විදුහල්පතිවරුන්

## පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය නිර්ණය කිරීම

පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව නිර්ණය කිරීම හා ඌනතා / අතිරික්ත සමනය කිරීමට උපදෙස් සැපයීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ. මෙම චක්‍රලේඛයේ විධි විධාන 2015 අප්‍රේල් 02 දින සිට බලපැවැත්වෙන අතර මේ සම්බන්ධයෙන් පෙර නිකුත් කර ඇති මගේ 2003/38 දරන චක්‍රලේඛය ඇතුළු චක්‍රලේඛ හා ඒවාට ඊට අදාළ සියලුම සංශෝධන ඉන් පසු බල රහිත වේ.

1. මෙම චක්‍රලේඛයේ කාර්යයන් සඳහා ඇමුණුම 01 හි දක්වා ඇති සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් අදාළ වේ.
2. පාසලේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව හා පංති සංඛ්‍යාව පාදක කරගත්, මෙහි ඇමුණුම 01 හි දක්වා ඇති වගුවල උපදෙස් අනුව පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය නිර්ණය කර සටහන් කර ගත යුතුය. ඒ සඳහා ඇමුණුම 02 හි සඳහන් ආකෘතිය භාවිතා කරන්න.
3. එක් ඉගෙනුම් මාධ්‍යයකට වඩා ඇති පාසල්වල ඒ ඒ මාධ්‍යයට අදාළ ශිෂ්‍ය සංඛ්‍යාවට අනුව සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙන වෙනම ගණනය කළ යුතුය.
4. ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන් පැවැත්වෙන පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඇතැම් විෂයයන් ඉගැන්වෙන විට එය ද වෙනම මාධ්‍යයක් ලෙස සලකා අධ්‍යයන කාර්ය මණ්ඩලය ගණනය කල යුතුය.
5. සිටින ගුරු සංඛ්‍යාව සටහන් කිරීමේදී ගුරුවරයා පත්වීම ලබා ඇති ගණයට ඇතුළත්වන සේ එය කළ යුතුය. (නිද. ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස පත්වීම ලබා දැනට ප්‍රාථමික ගුරුවරයකු ලෙස ඉගැන්වූවත් ඔහු / ඇය ඉංග්‍රීසි ගුරුවරයකු ලෙස සටහන් කළ යුතුය.)
6. පාසලින් වැටුප් ලබන සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලය පාසලට අයත් සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය ලෙස සැලකිය යුතුය.
7. සිටිය යුතු සංඛ්‍යාව හා සිටින සංඛ්‍යා මාධ්‍ය අනුව සටහන් කළ පසුව පාසල්වල අධ්‍යයන කාර්ය මණ්ඩල ඌනතා / අතිරික්ත ඒ අනුව නිර්ණය කර ගත යුතුය.
8. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින ගැටළු සම්බන්ධයෙන් අවසාන තීරණය ලබා දීමේ බලය අධ්‍යාපන ලේකම් සතුය.

උපාලි මාරසිංහ
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

ඇමුණුම 01

## 01. ප්‍රාථමික අංශය සඳහා සිටිය යුතු ගුරු සංඛ්‍යාව

| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සිටිය යුතු ගුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | ප්‍රාථමික පොදු | ඉංග්‍රීසි | දෙවන ජාතික භාෂාව |
| සිසුන් 25 හෝ ඊට අඩු | 3* | 1 | - |
| 51 – 80 | 3 | 1 | - |
| 81 – 120 | 4 | 1 | - |
| 121 – 160 | 5 | 1 | - |
| 161 – 200 | 6 | 1 | - |
| 201 - 240 | 7 | 1 | 1 |
| 241 – 280 | 8 | 1 | 1 |
| 281 – 320 | 9 | 1 | 1 |
| 321 – 360 | 10 | 1 | 1 |
| 361 – 400 | 11 | 1 | 1 |
| 401 – 440 | 12 | 1 | 1 |
| 441 – 480 | 13 | 2 | 1 |
| 481 – 520 | 14 | 2 | 1 |
| 521 – 560 | 15 | 2 | 1 |
| 561 – 600 | 16 | 2 | 1 |
| 601 – 640 | 17 | 2 | 1 |
| 641 – 680 | 18 | 3 | 1 |
| 681 – 720 | 19 | 3 | 1 |
| 721 – 760 | 20 | 3 | 1 |
| 761 – 800 | 21 | 3 | 1 |
| 801 – 840 | 22 | 3 | 1 |
| 841 – 880 | 23 | 3 | 1 |
| 881 – 920 | 24 | 3 | 1 |
| 921 – 960 | 25 | 3 | 1 |
| 961 – 1000 | 26 | 3 | 1 |
| 1001 – 1040 | 27 | 3 | 1 |
| 1041 – 1080 | 28 | 4 | 1 |
| 1081 – 1120 | 29 | 4 | 1 |
| 1121 – 1160 | 30 | 4 | 1 |
| 1161 – 1200 | 31 | 4 | 1 |
| 1201 – 1240 | 32 | 4 | වැඩිවන ප්‍රාථමික සිසුන් 1200 කට හෝ ඉන් කොටසකට එක් දෙවන ජාතික භාෂාවගුරුවරයකු ලබා දීමෙන් මෙම වගුව තවදුරටත් දික් කළ හැකිය. |
| 1241 – 1280 | 33 | වැඩිවන ප්‍රාථමික සිසුන් 400 කට හෝ ඉන් කොටසකට එක් ඉංග්‍රීසි ගුරුවරයකු ලබා දීමෙන් මෙම වගුව තවදුරටත් දික් කළ හැකිය. | |
| 1281 – 1320 | 34 | | |
| 1321 – 1360 | 35 | | |
| 1361 – 1400 | 36 | | |
| | වැඩිවන ප්‍රාථමික සිසුන් 40කට හෝ ඉන් කොටසකට එක් ප්‍රාථමික පොදු ගුරුවරයකු ලබා දීමෙන් මෙම වගුව තවදුරටත් දික් කළ හැකිය. | | |
| | * සිසුන් 25 ට අඩු පාසලක් පවත්වා ගැනීමට ඇති අවශ්‍යතාව පළාත් ව්‍යුහ කමිටුව මගින් වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය. පවත්වා ගැනීමට අවශ්‍ය බවට තීරණය කෙරෙන විට ප්‍රාථමික පොදු ගුරුවරුන් 3 ක් ලබා දිය යුතුවේ. | | |

## 02. ද්විතියික අංශය සඳහා සිටිය යුතු ගුරු සංඛ්‍යාව (සෞන්දර්යය විෂයයන් හා ආගම විෂය හැර)

| 6-11 ද්විතියික අංශයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සිටිය යුතු ගුරු සංඛ්‍යාව | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | විද්‍යා | ගණිත | ඉංග්‍රීසි | තාක්ෂණික | දෙවන ජාතික භාෂාව | මව්බස (සිංහල / දෙමළ) | පොදු |
| 1-80 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 1 |
| 81-140 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 |
| 141-200 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 2 |
| 201-240 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 2 |
| 241-280 | 2 | 2 | 1 | 1 | 1 | 1 | 2 |
| 281-320 | 2 | 2 | 2 | 1 | 1 | 1 | 2 |
| 321-360 | 2 | 2 | 2 | 1 | 1 | 2 | 3 |
| 361-400 | 2 | 2 | 2 | 1 | 1 | 2 | 3 |
| 401-440 | 2 | 2 | 2 | 1 | 1 | 2 | 3 |
| 441-480 | 2 | 2 | 2 | 1 | 1 | 2 | 3 |
| 481-520 | 3 | 3 | 2 | 2 | 1 | 2 | 4 |
| 521-560 | 3 | 3 | 2 | 2 | 1 | 2 | 4 |
| 561-600 | 3 | 3 | 2 | 2 | 1 | 2 | 4 |
| 601-640 | 3 | 3 | 3 | 2 | 1 | 3 | 4 |
| 641-680 | 3 | 3 | 3 | 2 | 1 | 3 | 5 |
| 681-720 | 3 | 3 | 3 | 2 | 1 | 3 | 5 |
| 721-760 | 4 | 4 | 3 | 2 | 1 | 3 | 5 |
| 761-800 | 4 | 4 | 3 | 2 | 1 | 3 | 5 |
| 801-840 | 4 | 4 | 3 | 2 | 1 | 3 | 6 |
| 841-880 | 4 | 4 | 3 | 2 | 1 | 4 | 6 |
| 881-920 | 4 | 4 | 4 | 2 | 1 | 4 | 6 |
| 921-960 | 4 | 4 | 4 | 2 | 1 | 4 | 6 |
| 961-1000 | 5 | 5 | 4 | 3 | සිසුන්960 කට හෝ ඉන් කොටසකට එක ගුරුවරයෙකු ලබා දීමෙන් මෙම වගුව තව දුරටත් දීර්ඝ කළ හැකිය | 4 | 7 |
| 1001-1040 | 5 | 5 | 4 | 3 | | 4 | 7 |
| 1041-1080 | 5 | 5 | 4 | 3 | | 4 | 7 |
| 1081-1120 | 5 | 5 | 4 | 3 | | 5 | 7 |
| 1121-1160 | 5 | 5 | 4 | 3 | | 5 | 8 |
| 1161-1200 | 5 | 5 | 5 | 3 | | 5 | 8 |
| 1201-1240 | 6 | 6 | 5 | 3 | | 5 | 8 |
| 1241-1280 | 6 | 6 | 5 | 3 | | 5 | 8 |
| 1281-1320 | 6 | 6 | 5 | 3 | | 5 | 9 |
| 1321-1360 | 6 | 6 | 5 | 3 | | සිසුන් 240කට හෝ ඉන් කොටසකට එක ගුරුවරයෙකු ලබා දීමෙන් මෙම වගුව තව දුරටත් දීර්ඝ කළ හැකිය. | 9 |
| 1361-1400 | 6 | 6 | 5 | 3 | | | 9 |
| 1401-1440 | 6 | 6 | 5 | 3 | | | 9 |
| | සිසුන් 240 කට හෝ ඉන් කොටසකට එක ගුරුවරයෙකු ලබා දීමෙන් මෙම වගුව තව දුරටත් දීර්ඝ කළ හැකිය. | සිසුන් 240 කට හෝ ඉන් කොටසකට එක ගුරුවරයෙකු ලබා දීමෙන් මෙම වගුව තව දුරටත් දීර්ඝ කළ හැකිය. | සිසුන් 280 කට හෝ ඉන් කොටසකට එක ගුරුවරයෙකු ලබා දීමෙන් මෙම වගුව තව දුරටත් දීර්ඝ කළ හැකිය. | සිසුන් 480 කට හෝ ඉන් කොටසකට එක ගුරුවරයෙකු ලබා දීමෙන් මෙම වගුව තව දුරටත් දීර්ඝ කළ හැකිය. | | | සිසුන් 160කට හෝ ඉන් කොටසකට එක ගුරුවරයෙකු ලබා දීමෙන් මෙම වගුව තව දුරටත් දීර්ඝ කළ හැකිය. |

03. ද්විතීයික අංශයේ සෞන්දර්යය විෂය සඳහා සිටිය යුතු ගුරු සංඛ්‍යාව (6-11 ශ්‍රේණි සඳහා)

| අදාළ සෞන්දර්යය විෂයය ඉගෙන ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව | සෞන්දර්යය විෂයය ගුරුවරුන් |
|---|---|
| 30 - 240 | 1 |
| 241 - 480 | 2 |
| 481 - 960 | 3 |
| 961ට වැඩි | 4 |

ඉහත වගුවට අනුව සෞන්දර්යය ගුරුවරයකු නොලැබෙන විටදී සියළුම 6-11 ශිෂ්‍ය සංඛ්‍යාව 30 ක් හෝ ඊට වැඩි නම් කවර හෝ එක් සෞන්දර්යය ගුරුවරයකු ලබා දිය යුතුය.

සෞන්දර්ය ගුරුවරයාගේ සේවය ප්‍රාථමික අංශයේ විශේෂ අවශ්‍යතා සඳහා ද ලබා දිය යුතුය.

04. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගුරුවරුන් (ICTගුරුවරුන්)

(අ) **විෂය ඉගැන්වීමේ මෙවලමක් ලෙස පරිගණක භාවිතය සඳහා පරිගණක විද්‍යාගාරය භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය හා පාසල් කළමනාකරණ කටයුතු සඳහා IT භාවිතය සඳහා අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව**

පාසලේ විධිමත් (පරිගණක 10 හෝ ඊට වැඩි) පරිගණක විද්‍යාගාරයක් තිබිය යුතු අතර 500 ට වැඩි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටිය යුතුය. එවිට එක් ගුරුවරයකු හිමිවේ. එසේ නොමැති පාසල්වල පරිගණක දැනුම ඇති ගුරුවරයෙකු සතියකට පැය 10 ක කාලයක් නිදහස් කර පාසල් කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය පරිගණක මඟින් ඉටු කරගත යුතු කාර්යයන් සඳහා යොදවා ගත හැකිය.

(ආ) **ද්විතියික අංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ඉගැන්වීම සඳහා සිටිය යුතු ගුරු සංඛ්‍යාව**

| 10-11 ශ්‍රේණිවල තොරතුරු තාක්ෂණ විෂයය ඉගෙන ගන්නා සිසුන් සංඛ්‍යාව | සිටිය යුතු ගුරු සංඛ්‍යාව |
|---|---|
| 10 ට අඩු | 0 |
| 11 - 480 | 1 |
| 481 - 680 | 2 |
| 681 - 960 | 3 |
| 961 ට වැඩි | 4 |

05. ආගම විෂයය සඳහා සිටිය යුතු ගුරු සංඛ්‍යාව

බුද්ධාගම, කතෝලික ආගම, කතෝලික නොවන ක්‍රිස්තියානි, හින්දු ආගම හා ඉස්ලාම් ආගම යන ආගම් සඳහා එක් එක් වර්ගයකින් සිටින 1 - 11 සිසුන් සංඛ්‍යාව අනුව ඒ ඒ ආගම සඳහා ගුරුවරුන් හිමි වේ.

| අදාළ ආගමට අයත් 1 – 11 සිසුන් සංඛ්‍යාව | එක් එක් ආගම ඉගැන්වීම සඳහා සිටිය යුතු ගුරු සංඛ්‍යාව |
|---|---|
| 4 - 240 | * වෙනත් පාසලක් සමඟ ඒකාබද්ධව පාසල් 2ම සඳහා ගුරුවරයකු ලබා දිය හැකිය. |
| 241 - 480 | 1 |
| 481 හා ඊට වැඩි | සෑම සිසුන් 480 ට ම 1 බැගින් ගුරුවරුන් ලබාදිය යුතුය. |

ඉහත තත්ත්වයන් යටතේ ලබා දෙන ආගමික ගුරුවරයාට සතියකට පැය 20 කට අඩුවෙන් ආගමික විෂයය කාල ඡේද යෙදී ඇත්නම් එම ගුරු භවතාට තම හැකියාවන් අනුව සුදුසු වෙනත් විෂයයන් / රාජකාරි ද පැවරිය යුතුය.

## 06. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ගුරුවරු

ශාරීරික අධ්‍යාපන ගුරු අවශ්‍යතා තීරණය කිරීමේ දී පහත කරුණු සැලකිල්ලට ගත යුතු වේ.

| පාසලේ ස්වභාවය | නියමිත ගුරු සංඛ්‍යාව |
|---|---|
| පාසලේ සිසුන් 200 - 2000 අතර | 1 |
| පාසලේ සිසුන් 2001 - 3000 අතර | 2 |
| පාසලේ සිසුන් 3000 ට වැඩි | 3 |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව ක්‍රීඩා පාසල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පාසල් | 5 |

## 07. විශේෂ අධ්‍යාපනය සඳහා ගුරුවරු

විශේෂ අධ්‍යාපන ඒකක අනුමත කොට පිහිටුවා ඇති පාසල්වලට ඒ සඳහා 1:5 ගුරු සිසු අනුපාතය අනුව ඒ සඳහා විශේෂයෙන් පුහුණු කරන ලද ගුරුවරුන් නියමිත ගුරු සංඛ්‍යාවට ඇතුළත් කළ හැකිය.

## 08. ශිෂ්‍ය උපදේශන කාර්යය සඳහා ගුරුවරුන්

6-13 ශිෂ්‍ය සංඛ්‍යාව 300 ඉක්මවන පාසලක ශිෂ්‍ය උපදේශන කටයුතු සඳහා එක් ගුරු භවතකු පූර්ණ කාලීනව යොදා ගත හැකිය. 6-13 සිසුන් සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා වෙනත් ගුරුවරයෙකු සතියට පැය 10 ක කාලයක් නිදහස් කර යොදවා ගත යුතුය.

## 09. පුස්තකාල කටයුතු භාර ගුරුවරුන්

1-13 සිසුන් 500කට වැඩියෙන් සිටින හා විධිමත් පුස්තකාලයක් සහිත පාසලකට පුස්තකාල කටයුතු සඳහා ගුරුවරයෙකු සිටිය යුතු ගුරු සංඛ්‍යාවට ඇතුළත් කළ හැකිය.

## 10. අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා විෂයය ධාරාව සඳහා සිටිය යුතු ගුරු සංඛ්‍යාව

| | විද්‍යා අංශයේ එක් විෂය ධාරාවක් පමණක් ඇත්නම් නියමිත ගුරු සංඛ්‍යාව | | | විද්‍යා අංශයේ විෂය ධාරා එකකට වඩා ඇත්නම් නියමිත ගුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| පන්ති සංඛ්‍යාව | ප්‍රධාන විෂයයන් සඳහා | අතිරේක විෂයයන් සඳහා | එකතුව | ප්‍රධාන විෂයයන් සඳහා | අතිරේක විෂයයන් සඳහා | එකතුව |
| 1 | 2 | 1 | 3 | | | |
| 2 | 2 | 1 | 3 | 3 | 1 | 4 |
| 3 | 3 | 1 | 4 | 3 | 1 | 4 |
| 4 | 4 | 1 | 5 | 4 | 1 | 5 |
| 5 | 5 | 2 | 7 | 6 | 2 | 8 |
| 6 | 6 | 2 | 8 | 7 | 2 | 9 |
| 7 | 7 | 2 | 9 | 7 | 2 | 9 |
| 8 | 8 | 2 | 10 | 8 | 2 | 10 |
| 9 | 9 | 2 | 11 | 8 | 2 | 10 |
| 10 | 10 | 2 | 12 | 10 | 2 | 12 |

වැඩි වන සෑම පන්තියකට ප්‍රධාන විෂයයන් සඳහා එක් ගුරුවරයකු බැගින් ද, අතිරේක විෂයයන් සඳහා වැඩි වන පන්ති 04 කට එක් ගුරුවරයෙකු බැගින් ද ලබා දිය යුතුය.

11. අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණ විෂයය ධාරාව සඳහා සිටිය යුතු ගුරු සංඛ්‍යාව

| | තාක්ෂණ අංශයේ එක් විෂයය ධාරාවක් පමණක් ඇත්නම් නියමිත ගුරු සංඛ්‍යාව | | | තාක්ෂණ අංශයේ විෂයය ධාරා එකකට වඩා ඇත්නම් නියමිත ගුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| පන්ති සංඛ්‍යාව | ප්‍රධාන විෂයයන් සඳහා | අතිරේක විෂයයන් සඳහා | එකතුව | ප්‍රධාන විෂයයන් සඳහා | අතිරේක විෂයයන් සඳහා | එකතුව |
| 1 | 2 | 1 | 3 | | | |
| 2 | 2 | 1 | 3 | 3 | 1 | 4 |
| 3 | 3 | 1 | 4 | 3 | 1 | 4 |
| 4 | 4 | 1 | 5 | 4 | 1 | 5 |
| 5 | 5 | 2 | 7 | 6 | 2 | 8 |
| 6 | 6 | 2 | 8 | 7 | 2 | 9 |
| 7 | 7 | 2 | 9 | 7 | 2 | 9 |
| 8 | 8 | 2 | 10 | 8 | 2 | 10 |
| 9 | 9 | 2 | 11 | 8 | 2 | 10 |
| 10 | 10 | 2 | 12 | 10 | 2 | 12 |

වැඩි වන සෑම පන්තියකට ප්‍රධාන විෂයයන් සඳහා එක් ගුරුවරයකු බැගින් ද, අතිරේක විෂයයන් සඳහා වැඩි වන පන්ති 04 කට එක් ගුරුවරයෙකු බැගින් ද ලබා දිය යුතුය.

12. අ.පො.ස. (උසස් පෙළ) කලා / වානිජ විෂයය ධාරා සඳහා සිටිය යුතු ගුරු සංඛ්‍යාව

| | කලා / වානිජ අංශයේ එක් විෂයය ධාරාවක් පමණක් ඇත්නම් නියමිත ගුරු සංඛ්‍යාව | | | කලා / වානිජ අංශයේ විෂයය ධාරා එකකට වඩා ඇත්නම් නියමිත ගුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| පන්ති සංඛ්‍යාව | ප්‍රධාන විෂයයන් සඳහා | අතිරේක විෂයයන් සඳහා | එකතුව | ප්‍රධාන විෂයයන් සඳහා | අතිරේක විෂයයන් සඳහා | එකතුව |
| 1 | 2 | 1 | 3 | | | |
| 2 | 2 | 1 | 3 | 3 | 1 | 4 |
| 3 | 3 | 1 | 4 | 3 | 1 | 4 |
| 4 | 4 | 1 | 5 | 4 | 1 | 5 |
| 5 | 5 | 2 | 7 | 6 | 2 | 8 |
| 6 | 6 | 2 | 8 | 7 | 2 | 9 |
| 7 | 7 | 2 | 9 | 7 | 2 | 9 |
| 8 | 8 | 2 | 10 | 8 | 2 | 10 |
| 9 | 9 | 2 | 11 | 8 | 2 | 10 |
| 10 | 10 | 2 | 12 | 10 | 2 | 12 |

වැඩි වන සෑම පන්තියකට ප්‍රධාන විෂයයන් සඳහා එක් ගුරුවරයකු බැගින් ද, අතිරේක විෂයයන් සඳහා වැඩිවන පන්ති 04 කට එක් ගුරුවරයෙකු බැගින් ද ලබා දිය යුතුය.

13. ප්‍රාථමික අංශයේ ( 1 - 5 ශ්‍රේණි) සඳහා අධීක්ෂක ගුරුවරු

| 1 - 5 ශ්‍රේණිවල ලේඛනගත ශිෂ්‍ය සංඛ්‍යාව | සිටිය යුතු අධීක්ෂක ගුරුවරුන් සංඛ්‍යාව |
|---|---|
| 250 දක්වා | 0 |
| 251 - 550 | 1 |
| 551 - 850 | 2 |
| 851 - 1150 | 3 |
| 1151 - 1450 | 4 |
| 1451 - 1750 | 5 |
| වැඩිවන සෑම සිසුන් 500 කට 01 අධීක්ෂක ගුරුවරයකු බැගින් ලබා දිය හැකිය. | |
| මෙම අධීක්ෂකවරුන් අවම වශයෙන් විනාඩි 40 කාල පරිච්ඡේද 18 ක් ඉගැන්වීම් කාර්යයේ නිරත විය යුතුය. | |

14. ද්විතීයික අංශයේ (6 - 11 ශ්‍රේණි) සඳහා අධීක්ෂක ගුරුවරුන්

| 6 -11 ශ්‍රේණිවල ලේඛනගත ශිෂ්‍ය සංඛ්‍යාව | සිටිය යුතු අධීක්ෂක ගුරුවරුන් සංඛ්‍යාව |
|---|---|
| 200 දක්වා | 0 |
| 201 - 300 | 1 |
| 301 - 480 | 2 |
| 481 - 720 | 3 |
| 721 - 1440 | 4 |
| 1441 - 1940 | 5 |
| වැඩි වන සෑම සිසුන් 500 කටම එක් අධීක්ෂක ගුරුවරයෙකු ලැබෙන සේ මෙම වගුව දික් කළ හැකිය. | |
| මෙම අධීක්ෂකවරුන් අවම වශයෙන් විනාඩි 40 ක කාල පරිච්ඡේද 16 ක් ඉගැන්වීම් කාර්යයෙහි නිරත විය යුතුය. | |

15. අ.පො.ස. උසස් පෙළ (12 - 13) ශ්‍රේණි සඳහා අධීක්ෂක ගුරුවරුන්

| උසස් පෙළ (12 – 13) ශ්‍රේණිවල ශිෂ්‍ය සංඛ්‍යාව | විෂයය ධාරා 1 ක් පමණක් ඇති විට | විෂයය ධාරා 2 ක් පමණක් ඇති විට | විෂයය ධාරා 3ක් හෝ ඊට වැඩි අවස්ථා වලදී |
|---|---|---|---|
| 100 හා ඊට අඩු | 0 | 0 | 0 |
| 101 - 210 | 0 | 1 | 1 |
| 211 - 480 | 1 | 1 | 1 |
| 481 - 960 | 1 | 2 | 2 |
| 960 ට වැඩි | 1 | 2 | 3 |
| මෙම අධීක්ෂකවරුන් අවම වශයෙන් විනාඩි 40 ක කාල පරිච්ඡේද 16 ක් ඉගැන්වීමේ කාර්යයෙහි ද නිරත විය යුතුය. | | | |

16. සිටිය යුතු සහකාර විදුහල්පති සංඛ්‍යාව

| පාසලේ ස්වභාවය | 1 - 5 ප්‍රාථමික අංශය සඳහා සහකාර විදුහල්පති සංඛ්‍යාව | ද්විතීයික අංශය සඳහා සහකාර විදුහල්පති සංඛ්‍යාව |
|---|---|---|
| (අ) 1 - 5 ප්‍රාථමික අංශයේ ලේඛනගත මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 500 ට වැඩි සහ 6 -11 ද්විතීයික අංශයේ ලේඛනගත මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 200 ට වැඩි යන තත්ත්ව දෙකම සපුරාලන පාසලකට | 02 | |
| (ආ) 6 - 11 ද්විතීයික අංශයේ ලේඛන ගත ශිෂ්‍ය සංඛ්‍යාව 500 ට වැඩි සහ උසස් පෙළ ශිෂ්‍ය සංඛ්‍යාව 100 ට වැඩි යන තත්ව දෙකම සපුරාලන පාසලකට | | 02 |
| කිසියම් පාසලක් (අ) සහ (ආ) යන අවස්ථා දෙකටම අයත් නම් එම අවස්ථා දෙකම යටතේ සහකාර විදුහල්පතිවරුන් ලබා ගත හැකිය. මෙම සහකාර විදුහල්පතිවරුන් ශ්‍රී ලංකා විදුහල්පති සේවය යටතේ ලබා දිය යුතු සංඛ්‍යාවක් ලෙස සැලකිය යුතුය. සහකාර විදුහල්පතිවරුන් සතියකට විනාඩි 40 කාල පරිච්ඡේද 12 ක් වත් ඉගැන්වීමේ නිරත විය යුතුය. | | |

## 17. නියෝජ්‍ය විදුහල්පති සංඛ්‍යාව

| පාසලේ ස්වභාවය | නියෝජ්‍ය විදුහල්පති සංඛ්‍යාව |
|---|---|
| උසස් පෙළ ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට වැඩි, 6- 11 ද්විතීයික අංශයේ ශිෂ්‍ය සංඛ්‍යාව 500 ට වැඩි සහ 1 -5 ප්‍රාථමික අංශයේ ශිෂ්‍ය සංඛ්‍යාව 500 ට වැඩි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2000 ට වැඩි වන පාසල් | 03 |
| ඉහත ගණයට නොවැටෙන නමුත් උසස් පෙළ ශිෂ්‍ය සංඛ්‍යාව 150 ට වැඩි සහ 6 -11 ද්විතියික අංශයේ ශිෂ්‍ය සංඛ්‍යාව 800 ට වැඩි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1500 ට වැඩි පාසල් | 02 |
| ඉහත ගණ දෙකට ම නොවැටෙන, නමුත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 400 ට වැඩි පාසල් | 01 |
| මෙම නියෝජ්‍ය විදුහල්පතිවරුන් විදුහල්පති සේවය යටතේ ලබාදිය යුතු සංඛ්‍යාවක් ලෙස සැලකිය යුතුය.<br>නියෝජ්‍ය විදුහල්පතිවරුන් සතියකට විනාඩි 40 කාල පරිච්ඡේද 10 ක් අවම වශයෙන් ඉගැන්වීම් කාර්යයෙහි යෙදිය යුතුය. | |

## 18.සිටිය යුතු විදුහල්පතිවරුන් සංඛ්‍යාව

සෑම පාසලකටම එක් විදුහල්පතිවරයෙකු සිටිය යුතුය.

මෙම විදුහල්පතිවරයා පාසලේ තත්ත්වය අනුව ශ්‍රී.ලං.අ.ප.සේ. හෝ ශ්‍රී.ලං.වි.ප.සේ. නිලධාරියකු විය යුතුය. විදුහල්පති පත්කිරීමේදී අදාළ සේවා ව්‍යවස්ථා මගින් තීරණය කර ඇති නිර්ණායක අනුව විය සිදු කළ යුතුය.

# ඇමුණුම 02

## පාසලක අධ්‍යයන කාර්ය මණ්ඩලය

________(වර්ෂය) ජූනි 01 දිනට

මාධ්‍යය : ________

1. පාසලේ නම :-
2. ලිපිනය :-
3. පළාත :-
4. කලාපය :-
5. කොට්ඨාසය :-
6. පාසලේ සංගණන අංකය :- | | | | | |

7. ලේඛනගත ශිෂ්‍ය සංඛ්‍යාව

| අංශය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| ප්‍රාථමික (1 – 5 ) | |
| ද්විතීයික (6-11) | |
| උසස් පෙළ (12-13) විද්‍යා | |
| උසස් පෙළ (12-13) තාක්ෂණ | |
| උසස් පෙළ (12-13) කලා | |
| උසස් පෙළ (12-13) වානිජ | |
| විශේෂ අධ්‍යාපන | |

08. පංති සංඛ්‍යාව

| අංශය | පංති සංඛ්‍යාව |
|---|---|
| ප්‍රාථමික (1-5) | |
| ද්විතීයික (6-11) | |
| උසස් පෙළ (12-13)විද්‍යා | |
| උසස් පෙළ (12-13) තාක්ෂණ | |
| උසස් පෙළ (12-13) කලා | |
| උසස් පෙළ (12-13) වානිජ | |
| විශේෂ අධ්‍යාපන | |

09. සිටිය යුතු ගුරු සංඛ්‍යාව හා සිටින ගුරු සංඛ්‍යාව

| ගුරු වර්ගය | | | සිටිය යුතු | සිටින | ඌන | අතිරික්ත |
|---|---|---|---|---|---|---|
| ප්‍රාථමික අංශය (1-5) | 9.1 | ප්‍රාථමික පොදු | | | | |
| | 9.2 | ඉංග්‍රීසි | | | | |
| | 9.3 | දෙවන ජාතික භාෂාව * (දෙමළ හෝ සිංහල) | | | | |
| ද්විතීයික (6-11) | 9.4 | විද්‍යාව | | | | |
| | 9.5 | ගණිතය | | | | |
| | 9.6 | ඉංග්‍රීසි | | | | |
| | 9.7 | තාක්ෂණික විෂයයන් | | | | |
| | 9.8 | ICT ගුරුවරුන් (අ) | | | | |
| | 9.9 | දෙවන ජාතික භාෂාව * (දෙමළ හෝ සිංහල) | | | | |
| | 9.10 | මව්බස (සිංහල / දෙමළ) | | | | |
| | 9.11 | ආගම | | | | |
| | | 9.11.1 බුද්ධාගම | | | | |
| | | 9.11.2 හින්දු | | | | |
| | | 9.11.3 ඉස්ලාම් | | | | |
| | | 9.11.4 රෝමානු කතෝලික | | | | |
| | | 9.11.5 ක්‍රිස්තියානි (රෝ.ක. නොවන) | | | | |
| | 9.12 | පොදු | | | | |
| | 9.13 | සෞන්දර්යය ගුරුවරුන් | | | | |

| | | ගුරු වර්ගය | සිටිය යුතු | සිටින | ඌන | අතිරික්ත |
|---|---|---|---|---|---|---|
| අ.පො.ස. උසස් පෙළ (12-13) | 9.14 | විද්‍යා විෂයය ධාරාව (ප්‍රධාන විෂයයන්) | | | | |
| | 9.15 | විද්‍යා විෂයය ධාරාව (අතිරේක විෂයයන්) | | | | |
| | 9.16 | තාක්ෂණ විෂයය ධාරාව (ප්‍රධාන විෂයයන්) | | | | |
| | 9.17 | තාක්ෂණ විෂයය ධාරාව (අතිරේක විෂයයන්) | | | | |
| | 9.18 | කලා විෂයය ධාරාව (ප්‍රධාන විෂයයන්) | | | | |
| | 9.19 | කලා විෂයය ධාරාව (අතිරේක විෂයයන්) | | | | |
| | 9.20 | වානිජ විෂයය ධාරාව (ප්‍රධාන විෂයයන්) | | | | |
| | 9.21 | වානිජ විෂයය ධාරාව (අතිරේක විෂයයන්) | | | | |
| | 9.22 | ශිෂ්‍ය උපදේශන කාර්යයේ නියුතු ගුරුවරුන් | | | | |
| | 9.23 | පුස්තකාල කටයුතු භාර ගුරුවරුන් | | | | |
| | 9.24 | ICT ගුරුවරුන් (ආ) | | | | |
| | 9.25 | ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් | | | | |
| | 9.26 | විශේෂ අධ්‍යාපන ගුරුවරුන් | | | | |
| | 9.27 | ප්‍රාථමික (1-5) අධීක්ෂක ගුරුවරුන් | | | | |
| | 9.28 | ද්විතීයික (6-11) අධීක්ෂක ගුරුවරුන් | | | | |
| | 9.29 | උසස් පෙළ විද්‍යා විෂය ධාරාවේ අධීක්ෂක ගුරුවරුන් | | | | |
| | 9.30 | උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාවේ අධීක්ෂක ගුරුවරුන් | | | | |
| | 9.31 | උසස් පෙළ කලා / වානිජ විෂය ධාරාවල අධීක්ෂක ගුරුවරුන් | | | | |
| | 9.32 | පාසලින් වැටුප් ලබන නමුත් පාසලට සේවාව නොලැබෙන ගුරුවරුන් (වෙනත් කාර්යයක් / ආයතනයක් වෙත පූර්ණකාලීනව අනුයුක්ත කර හෝ පූර්ණ කාලීනව නිදහස් කර ඇති නිසා) | | | | |

* සිංහල මාධ්‍ය සිසුන් සඳහා දෙවන ජාතික භාෂාව දෙමළ ද, දෙමළ මාධ්‍ය සිසුන් සඳහා එය සිංහල ද වන බව සලකන්න.

10. **ශ්‍රී.ලං.අ.ප.සේ. හෝ ශ්‍රී. ලං.වි.ප.සේ. නිලධාරීන්**

| | | වර්ගය | සිටිය යුතු | සිටින | ඌන | අතිරික්ත |
|---|---|---|---|---|---|---|
| | 10.1 | සහකාර විදුහල්පතිවරුන් | | | | |
| | 10.2 | නියෝජ්‍ය විදුහල්පතිවරුන් | | | | |
| | 10.3 | විදුහල්පති | | | | |

11. **වෙනත් ගුරුවරු (ඉහත කිසිදු වර්ගීකරණයකට හසු නොවූ ගුරුවරුන් සිටීත් නම් පමණක් පහත කොටුවේ ඇතුලත් කරන්න. විස්තර ලියා වෙනම ලිපියක් අමුණන්න)**

| | | වර්ගය | සිටිය යුතු | සිටින | ඌන | අතිරික්ත |
|---|---|---|---|---|---|---|
| | 11.1 | | | | | |
| | 11.2 | | | | | |
| | 11.3 | | | | | |